# ලොව වටා පුවත් වියමන

# ජපානය ගිලගත් සුනාමිය

ශ්‍රීලාල් සෙනෙවිරත්න

මෑත ඉතිහාසයේ ජපානය මුහුණ දුන් දෙවැනි මහා ව්‍යසනය අපට අසන්නටත් දකින්නටත් ලැබුණේ ඉකුත් මාර්තු මාසයේදීය. එහි ආරම්භක සංඥාව ජපානයේ සෙන්ඩායි නුවරින් කිලෝ මීටර් 100 ක් තරම් ඈත මුහුදු පත්ලෙන් නිකුත් කෙරුණේ මාර්තු 11 දින එරට වේලාවෙන් සවස 2.45ට පමණය. රික්ටර් මාපකයේ 8.9ක් ලෙස දැක්වුණු භූමිකම්පාවක් වූ එය ජපානය සහ අවට දූපත්වලට සුනාමි අනතුරු ඇඟවීමක් සිදුකර පැය භාගයක් ගතවෙන්නටත් කලින් මීටර් දහයක් පමණ උසට නැගි මුහුදු රළ ජපානය ගිලගනිමින් රට තුළට කඩා වැදුනේය.

ජපානයේ ප්‍රධාන දූපත් හතරෙන් විශාලතම දූපත වන හොන්ෂු දූපතේ ෆුකුෂිමා ප්‍රාන්තය ගිලගත් සුනාමි රළ විනාඩි ගණනාවක් ඇතුළත දහස් ගණනක් මරු තුරුළට ගෙනයමින් බිලියන ගණනාවක් වටිනා දේපොළ සුන්බුන් ගොඩවල් බවට පත්කළ ආකාරය ලෝකයේ බොහෝ දෙනා රූපවාහිනී තිර ඉදිරියේ සිට විශ්මයෙන් සහ ශෝකයෙන් යුතුව බලා සිටියහ. ඊසාන දිග ජපානයේ පිහිටි සෙන්දායි ගුවන් තොටුපොළ අඩි තිහක් පමණ උසට මුහුදු ජලයෙන් වැසීයාමත් සමග එහි තිබූ ගුවන්යානා ජලයේ ඒ මේ අත ගසාගෙන ගියේ කඩදාසි ඔරු මෙනි. සෙන්දායි හි ඇති කෘෂිකාර්මික ඉඩම් අක්කර දශලක්ෂ ගණනක් මුළුමනින්ම විනාශ විය. ටොයොටා සහ හොන්ඩා සමාගම්වල වාහන නිෂ්පාදනය කෙරෙන දැවැන්ත කර්මාන්ත ශාලාවලට බලවත් හානි සිදුවිය. ලෝකයේ විශාලතම න්‍යෂ්ඨික බලාගාර 15 අතරට වැටෙන ෆුකුෂිමා බලාගාරයේ ඇතිවූ පිපිරීම් සහ විකිරණ කාන්දුවීම සුනාමියෙන් ජපානය මුහුණ දුන් බරපතලම ව්‍යසනය විය. ගිගා වොට් 7.5 ක විදුලියක් උත්පාදනය කෙරෙන එම බලාගාරය න්‍යෂ්ඨික ප්‍රතික්‍රියක හයකින් සමන්විත වන අතර ඉන් තුනක් පුපුරා ගිය අතර මෙය ලියන අවස්ථාව වන විටත් ඒවායින් සිදුවන විකිරණ කාන්දුව නවත්වා ගන්නට ජපාන බලධාරීන්ට හැකියාවක් ලැබී නොමැත.

ජපානයේ විදුලි බල නිෂ්පාදනයෙන් 30%ක් නිපදවෙන්නේ න්‍යෂ්ඨික බලාගාරවලිනි. එරට න්‍යෂ්ඨික විදුලි බලාගාර 50 ක් පමණ ඇති අතර ඉන් 11ක් පිහිටා ඇත්තේ සුනාමි ව්‍යසනයට ලක්වූ ප්‍රදේශයේය. මේ බලාගාර භූමිකම්පා, සුනාමි වැනි ස්වාභාවික ආපදාවන්ට ඔරොත්තු දෙන ආකාරයෙන් ගොඩනගා ඇතත් මෙවර ඇතිවූ ව්‍යසනයෙන් ඒවාට විවිධ හානි සිදුවිය.

න්‍යෂ්ඨික විදුලි බලාගාරවල විදුලිය උත්පාදනය කෙරෙන්නේ විකිරණශීලි මූල ද්‍රව්‍ය න්‍යෂ්ඨික විකණ්ඩයට ලක්කිරීමේ රසායනික හා තාක්ෂණික ක්‍රියාදාමයකිනි. යුරේනියම් 235 සමස්ථානිකය මේ සඳහා බහුලව යොදාගන්නා මූල ද්‍රව්‍යයයි. ගල් අඟුරු කිලෝ දශලක්ෂ ගණනක් දැවීමෙන් උපදවාගන්නා ශක්තිය යුරේනියම් කිලෝවක් න්‍යෂ්ඨික විකණ්ඩනයට ලක්කිරීමෙන් උපදවා ගත හැකි අතර මේ ක්‍රියාවලියේදී ඇතිවන අධික තාපය මගින් ජලය හුමාලය බවට පත්කර එමගින් විදුලිය උත්පාදන ටර්බයින් ක්‍රියාත්මක කිරීම විදුලි ජනන



ක්‍රමවේදයයි.

මෙම ක්‍රියාවලිය සිදුකෙරෙන්නේ එහිදී නිකුත් කෙරෙන අධික තාපය සහ න්‍යුට්‍රෝන පරිසරයට එකතු නොවන ආකාරයට තනන ලද විශේෂ කුටීර තුළය. ප්‍රතික්‍රියාකාරක ලෙසින් හැඳින්වෙන්නේ එකී කුටීරයි. ෆුකුෂිමා බලාගාරය මෙවැනි ප්‍රතික්‍රියක හයකින් සමන්විත අතර සුනාමි අවස්ථාව වන විට අලුත්වැඩියා කටයුතු සඳහා ඉන් තුනක් ක්‍රියාවිරහිත කර තිබී ඇත. පුපුරා යාමට ලක්වූයේ ක්‍රියාත්මක තත්ත්වයේ තිබූ ප්‍රතික්‍රියාකාරක වන අතර ඒවායේ සිසිලන පද්ධතිය අක්‍රියවීම නිසා පිපරීම්වලට ගිනි ගැනීම්වලටද ලක්ව තිබේ.

පර්යේෂකයන් විසින් අනාවරණය කරගෙන ඇති පරිදි මේ වන විටත් එම ප්‍රතික්‍රියාකාරකවලින් පරිසරයට විකිරණ පිටකරමින් පවතින අතර බලාගාරය අවට ජලයේ විකිරණ ගණත්වය විශාල වශයෙන් ඉහළගොස් තිබේ. ජපානයේ නැගෙනහිර වෙරළේ අයඩීන් සහ සීඩියම්වල විකිරණ පවතින බව සොයාගෙන ඇති අතර ඒවා සාගර සහ භූගත ජලයට එක්වීමෙන් ඉදිරියේදී බලවත් පාරිසරික ව්‍යසනයකට මුහුණ පෑමට සිදුවීමේ අවදානමකට ජපානය මුහුණ පා සිටී. විකිරණ ශරීරගතවීමෙන් ජීවින් විවිධ රෝගවලට සහ නව ජනකයන් ජාන විකෘතිතාවලට ගොදුරුවීම විසඳුම් දිය නොහැකි ව්‍යසනයකි.

ජපන් වැසියන්ගේ වාර්ෂික මත්ස්‍ය පරිභෝජනය මෙට්රික් ටොන් මිලියන නවයක් වන අතර ඊට අමතරව තවත් විශාල ප්‍රමාණයක් අපනයනය සඳහා සකස් කිරීමද සිදුවේ. එහෙත් විකිරණ කාන්දුව සම්බන්ධයෙන් පවතින බිය නිසා එරට ධීවර කර්මාන්තය විශාල අර්බුධයකට මුහුණ පා තිබේ.

භූමිකම්පාවෙන් සහ සුනාමියෙන් තම රටට සිදුවූ විපත දෙවන ලෝක යුද්ධයේදී සිය රට මුහුණ දුන් තත්ත්වයට නොදෙවෙනි බව ජපන් අගමැතිවරයා මාධ්‍ය හමුවේ කියා සිටියේ මේ සියලු තත්ත්වයන් සලකා බලාය. 1945 අගෝස්තු 6 සහ 9 ඇමරිකාව ජපානයේ හිරෝෂිමා සහ නාගසාකි දෙනුවරට පරමාණු බෝම්බ හෙළන ලදි. විනාඩි කීපයක් ඇතුළත මේ විසල් නගර දෙක දවා අළු කරන්නට එම ප්‍රහාරයට හැකියාව ලැබිණ. සිදුවූ හානිය සහ නැතිවූ ජීවිත සංඛ්‍යාව අති මහත්ය. අද ජපානය ලෝකයේ ඉදිරියෙන්ම සිටින රටක් බවට පත්ව ඇත්තේ ඒ ව්‍යසනයේ අළුමතින් නැගී සිටිමිනි.

ජපන් ඉතිහාසයේ වැඩිම දේපොළ හානියක් සිදුවූ ස්වාභාවින විපත ලෙස මේ දක්වා වාර්තාගතව තිබුණේ 1995 වසරේ ඇතිවූ භූමිකම්පාවකි. ඉන් සිදුවූ අලාභය ඇමරිකානු ඩොලර් කෝටි සියය ඉක්මවන බවට ගනන් බලා තිබුණි. මෙවර සිදුවූ හානිය සම්බන්ධයෙන් සිදුකළ මූලික ගණන් බැලීම් අනුව එය ඇමරිකානු ඩොලර් බිලියන දෙසීයකට ආසන්න බව සොයාගෙන තිබේ. ජපානයේ වැඩිම ජීවිත හානියක් වාර්තා කළ ස්වාභාවික විපත ලෙස සැළකෙන්නේ 1923 සැප්තැම්බර් 01 ටෝකියෝවට බලපෑ භූමිකම්පාවයි. එයින් මිය ගිය ගණන එක්ලක්ෂ හතලිස් දහසක් පමණය. ලෝකයේ සෙසු රටවල් සමග සැසඳීමේදී මෙලෙස නිරන්තරවම මහත් විනාශයන්ට මුහුණ දෙන රටක් ලෙස ජපානය හඳුනාගත හැකිය. එහෙත් ඒ සියලු ව්‍යසනයන්ට පසුව නැවතත් අළු මතින් නැගී සිටින ෆීනික්ස් පක්ෂියෙකු සේ කෙටි කලකින්ම නැවත නැගී සිටින්නට ජපානයට හැකියාව ලැබිණ. මේ මහා ව්‍යසනයෙන් පසුවද නැවතත් ඒ ෆීනික්ස් පක්ෂියා නැවත පණ ලබනු ඇතත් සිදුවූ ඛේදවාචකයේ අඳුරු මතකයන් දීර්ඝ කාලයක් යන තෙක් ජපන් ජනතා සිත් සතන්හි පවතිනු ඇත.

## දිනපොත

*මාර්තු*

*05. තමිල්නාඩුවේ ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් පක්ෂය ඉන්දීය සභාග ආණ්ඩුවෙන් ඉවත්වෙයි.*

*06. සිය දේශපාලන ප්‍රචාරක කටයුතු වෙනුවෙන විදෙස්ගත කාන්තාවකගෙන් මුදල් ත්‍යාගයක් ලබාගත් බව අනාවරණය වූ ජපන් විදේශ ඇමැති සෙයිජි මෙහෙරා සිය ධුරයෙන් ඉල්ලා අස්වෙයි.*

*11. ජපානයේ සෙන්ඩායි නුවර ආසන්නයේ ගැඹුරු මුහුදේ සිදුවූ ප්‍රබල භූමිකම්පාක් නිසා ඇතිවූ සුනාමියකින් ජපානයේ දහස් ගණනක් ජීවිතක්ෂයට පත්ව කෝටි ගණනක් වටිනා දේපොළ විනාශයට පත්වේ.*

*15. ලිබියා නායක කර්නල් මුවම්මර් ගඩාෆිට එරෙහිව වීදි බැස සිටින කැරළිකරුවෝ, ඔවුන් සතු මිග් 23 ප්‍රහාරක යානයක් සහ හෙලිකොප්ටරයක් යොදාගෙන ගඩාෆිට පක්ෂපාත නාවික හමුදාවේ යුද නැව් දෙකක් විනාශ කරයි.*

*18. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය විසින් ලිබියාවට ඉහළ අහස ගුවන් තහනම් කලාපයක් ලෙස නම් කරයි. ඒ සඳහා ඉදිරිපත් වූ යෝජනාව සම්බන්ධයෙන් පැවැති ඡන්දය විමසීමේදී ආරක්ෂක මණ්ඩලයේ සාමාජික රටවල් 15 න් 10 ක් යෝජනාවට පක්ෂව ඡන්දය දෙයි.*

*19. ලිබියා නායක මුවම්මාර් ගඩාෆිට එරෙහි සටන අරඹමින් ඇමරිකාව, බ්‍රිතාන්‍ය සහ ප්‍රංශය ලිබියාවේ ගුවන් හමුදා කඳවුරු වෙත ගුවන් ප්‍රහාර ආරම්භ කරයි. නිවැරදිව එල්ල කෙරුණු මිසයිල ප්‍රහාර සියයක අධික ප්‍රමාණයකින් ලිබියාවේ ගුවන් හමුදා කඳවුරු 20 ක් පමණ සම්පූර්ණයෙන් විනාශ වූ බව පෙන්ටගනය පවසයි.*

*ආණ්ඩුවට එරෙහිව යේමනයේ අගනුවර පැවැත්වෙන විරෝධතා ව්‍යාපාර උත්සන්න වෙයි. උද්ඝෝෂකයන්ට එලල කෙරුණු ස්නයිපර් ප්‍රහාරයන්ට ගොදුරුව හතලිස් දෙදෙනෙක් ජීවිතක්ෂයට පත්වේ.*

*20. යේමනයේ ආණ්ඩු විරෝධී උද්ඝෝෂකයන්ට ස්නයිපර් තුවක්කුකරුවන් එල්ල කළ වෙඩි ප්‍රහාරවලින් 42 දෙනෙකු ජීවිතක්ෂයට පත්වීමට විරෝධය පළකරමින් එරට පාලක පක්ෂයේ ජ්‍යෙෂ්ඨ ඇමැතිවරුන් දෙදෙනෙක් ඉල්ලා අස්වෙති.*

*24. ඊසාන දිග මියන්මාරයේ සිදුවූ ප්‍රබල භූමි කම්පාවකින් පුද්ගලයන් 75 දෙනෙකු ජීවිතක්ෂයට පත්ව තවත් පිරිසක් තුවාල ලබති.*

*26. විපක්ෂ කණ්ඩායම් විසින් ගෙන ආ විශ්වාසභංග යෝජනාවකින් කැනඩා අගමැති ස්ටීවන් හාපර්ගේ සුළුතර ආණ්ඩුව බිඳවැටේ.*